# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2160/62 - 2020 පෙබරවාරි මස 01 වැනි සෙනසුරාදා - 2020.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 (1) වගන්තිය යටතේ දැන්වීම**

මෑත අතීතයේදී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන්
අභ්‍යන්තරව අවතැන් වූ හා වෙනත් ස්ථානයක ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි නොවූ
ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා වූ පරිපූරක ලයිස්තුව - 2019

*මැතිවරණ කොට්ඨාසයේ අංකය සහ නම : 11 - වන්නි*

ඉහත දැක්වෙන මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ අවතැන් වූවන් සඳහා වූ පරිපූරක ලැයිස්තුවේ වැඩ නිම කර ඇති බව සහ එම ලැයිස්තුව කාර්යාල වේලාවන්හි දී මහජනයාට පරීක්ෂා කර බලා ගැනීම පිණිස මන්නාරම/වවුනියාව/මුලතිව් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල තබා ඇති බව 2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3(1) වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. යථෝක්ත අවතැන් වූ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාර ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ එකී පරිපූරක නාමලේඛනයේ තම නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තා වූ එහෙත් තම නම පරිපූරක ලැයිස්තුවේ ඇතුළත්ව නොමැති කිසිවෙකු විසින් තමාගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් අභියාචනා ඉදිරිපත් කර සිටින්නේ නම් එසේ අභියාචනා ඉදිරිපත් කර සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත පරිදි හඳුන්වා දී ඇති ආකෘති පත්‍රයෙන් වූ ඉල්ලීමක් මන්නාරම/වවුනියාව/මුලතිව් මැතිවරණ කාර්යාලවල ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ දින සිට සති 02 ක් ඇතුළත මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම මන්නාරම/වවුනියාව/මුලතිව් මැතිවරණ කාර්යාලවල ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබිය යුතුය.

1A - G 31999 — 57 (2020/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ පරිපූරක ලැයිස්තුවේහි නම ඇතුළත් ව ඇත්තා වූ යම් කෙනෙකුට තමාගේ නම හෝ එකී නාමලේඛනයේ නම සඳහන් වී ඇත්තා වූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කර තිබීම ගැන හෝ තිබෙන්නට හැරීම ගැන හෝ විරුද්ධතාව දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාව යථෝක්ත පනතේ නියම කර ඇති පරිදි අවස්ථාවෝචිතව ''ඈ'' ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, **මන්නාරම**/**වවුනියාව**/**මුලතිව්** මැතිවරණ කාර්යාලවල ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතුයි. නාමලේඛණයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවයක්ම මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත **මන්නාරම**/**වවුනියාව**/**මුලතිව්** මැතිවරණ කාර්යාලවල ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ලැබෙන සේ එවිය යුතු ය.

මෙම දැන්වීම **මන්නාරම**/**වවුනියාව**/**මුලතිව්** මැතිවරණ කාර්යාලයේ 2020 පෙබරවාරි මස 01 වැනි දින සිට 2020 පෙබරවාරි මස 14 දින දක්වා (එම දිනයද ඇතුළත්ව) ප්‍රදර්ශනය කරනු ඇත.

04. යම්කිසි හිමිකමක් ඉදිරිපත් කිරීම සඳහා ද යම්කිසි කෙනෙකුගේ නමක් නාමලේඛනයේ ඇතුළත් කරන ලෙස හෝ තිබෙන්නට හරින ලෙස හෝ වෙන යම් කෙනෙකු විසින් කරනු ලබන හිමිකම් ඉල්ලීමක් සඳහා විරුද්ධතාවයක් දැක්වීමට අවශ්‍ය ආකෘති පත්‍ර **මන්නාරම**/**වවුනියාව**/**මුලතිව්** පරිපාලන දිස්ත්‍රික්කවල ඉහත සඳහන් මැතිවරණ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

එම්. ජී. ලලිත් ආනන්ද,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාසයේ අංකය 11 - වන්නි.

2020 පෙබරවාරි මස 01 වැනි දින,
වවුනියාව මැතිවරණ කාර්යාලයේ දී ය.

02 - 540

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.